ලංසු සඳහා ආරාධනාවයි

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය **මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ**

1. මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අරුප්පල නැගෙනහිර වසමේ දුටුගැමුණු මාවතේ අරුප්පල නාගරික ක්‍රීඩා පිටිය අසල සිට අරුප්පල මාවත 01 දක්වා මාර්ගය සංවර්ධනය කිරීම (අඩි 600 ක් දිග අඩි 12 ක් පළල), පූජා දුණුකේව්ල ආනන්ද තිස්ස නාහිමි මාවත(වටගොඩ පන්සල පාර) ආරම්භයේ සිට පැති බැමි සමඟ සංවර්ධනය කර කාපට් නොකළ කොටස ඉදිරියට කාපට් කිරීම (අඩි 50 ක් දිග අඩි 15 ක් පළල) , පල්ලේගම විදාතා මධ්‍යස්ථානයේ අළුත්වැඩියාව සහ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා නිෂ්පාදන අලෙවිය සඳහා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා **මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ** ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සුදුසුකම්ලත් අසාධු ලේඛනගත නොවූ CIDA ආයතනයේ ලියාපදිංචි කරන ලද C 8, C 7, C 6 ශ්‍රේණිගත කරන ලද ආයතනයක් විය යුතුය. මිළ ගණන් සමඟ CIDA ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය (National Competitive Bidding) යටතේ ලංසු ආරාධනා කරනු ලැබේ.

2. ලංසුකරුවන් තෝරා ගැනිමේදී මීට පෙර කර ඇති සාර්ථක ඉදිකිරීම් පිළිබඳව සැලකිල්ලට ගන්නා අතර ඒ පිළිබඳ විස්තර ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.ලංසුවට අදාල වැඩිමනත් විස්තර **මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දුරකථන අංක 081-2225133 න් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී අමතා ලබාගත හැකිය.

3. ලංසු විස්තර www.Kandy.ds.gov.lk වෙබ් අඩවියේ "ප්‍රසම්පාදන" තීරුව මගින් තොරතුරු බලාගත හැකි අතර ලංසු ලියවිලි සඳහා 2026.10. 20 දින ප.ව.3 .00 දක්වා ගාස්තුව මුදලින් **මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය.

4. ලංසු ලියවිලිවල ඉල්ලා ඇති තාක්ෂණික මූලා හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛණවල සහතික කළ පිටපත් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

5. නිසි පරිදි සම්පූරණ කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයක බහා 2026.10.21 දින ප.ව 2.00 හෝ ඊට පෙර ලැබෙන සේ **මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ** ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ,මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහල වම් කෙලවර අදාල ලංසුවේ නම සඳහන් කළ යුතුය.

6. ප්‍රමාද වී ලැබෙන සහ නියමිත උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබාගත් පහත වගුවේ සඳහන් වටිනාකමින් හා ලංසු විවෘත කරන දින සිට වලංගු දින ගණනින් යුතු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ මුදලින් **මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු සුරක්ෂණ " **මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ** ප්‍රාදේශීය ලේකම් " නමින් ලබාගෙන තැන්පත් කර තිබීම අත්‍යාවශයවේ.

උපලේඛනයේ

අනු අංකය	කර්මාන්තය	මුළුපිරිවැය ඇස්තමේන්තුව රුපියල් (3% පරිපාලන වියදම් හා වැට් රහිතව)	අවශ්‍යා අවම CIDA ලියාපදංචිය	ලංසු සුරක්ෂණයේ වටිනාකම ආපසු ගෙවන		ලංසු සුරක්ෂණය සඳහා දින ගණන	ලංසු ලියවිලි ගාස්තුව ආපසු නොගෙවන
				බැංකු සහතිකය	මුදලින්		
				රුපියල්	රුපියල්		
01	අරුප්පල නැගෙනහිර වසමේ දුටුගැමුණු මාවතේ අරුප්පල නාගරික ක්‍රිඩා පිටිය අසල සිට අරුප්පල මාවත 01 දක්වා මාර්ගය සංවර්ධනය කිරිම (අඩි 600 ක් දිග අඩි 12 ක් පළල),	5,754,237.29	C 8 & C 7 C 6	85,000.00	85,000.00	105	1,500.00
2	පූජා දුණුකේවිල ආනන්ද තිස්ස නාහිමි මාවත(වටගොඩ පන්සල පාර) ආරම්භයේ සිට පැති බැමි සමඟ සංවර්ධනය කර කාපට් නොකළ කොටස ඉදිරියට කාපට් කිරීම (අඩි 50 ක් දිග අඩි 15 ක් පළල)	8,220,338.98	C 8 & C 7 C 6	120,000.00	120,000.00	105	3,000.00
3	පල්ලේගම විදාතා මධ්‍යස්ථානයේ අළුත්වැඩියාව	5,129,491.53	C 8 & C 7 C 6	80,000.00	80,000.00	105	1,500.00
4	මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා නිෂ්පාදන අලෙවිය සඳහා ගොඩනැගිල්ල ඉදි කිරීම	7,686,016.95	C 8 & C 7 C 6	115,000.00	115,000.00	105	2,500.00

7. පූර්ව ලංසු කැඳවීම් **(Pre Bid Meeting)** රැස්වීම 2026.10.15 දින පෙ.ව.10.00 ට මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන අතර, මිළ ගණන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන කොන්ත්‍රාත්කරුවන්ට මෙම රැස්වීමට සහභාගි වීමෙන් කාර්යේ ස්වාභාවය, පිරිවිතර, ප්‍රමාණයන්, ස්ථානීය තත්වයන් සහ අනෙකුත් අවශ්‍යතා පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත හැක.

8.ලංසු භාර ගන්නා වේලාව පසු වූ වහාම විවෘත කරනු ලැබේ.එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පැමිණ සහභාගි විය හැකිය.

10.ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනිම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසුව ප්‍රතික්ෂේප කිරිමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර,ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසන් තිරණය වේ.

අමිල නවරත්න
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ,
ප්‍රාදේශීය ලේකම්
මහනුවර කඩවත්සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,මහනුවර